# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2021.11.17

වර්ෂ 2021 ක් වූ නොවැම්බර් මස 17 වන බදාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ නොවැම්බර් මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**<u>මහා සභා රැස්වීම ආරම්භ වන විට සහභාගී වූ ගරු සභිකවරු</u>**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
04. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
05. ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
06. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
07. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
08. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
10. ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
11. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
12. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා විසින් මහා සභා රැස්වීමේ වාර්තා තබන ලදී.

**<u>(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම ඃ-</u>**

**<u>01. 2021-10-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම</u>**

2021-10-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ලියා ඇති පරිදි සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට යෝජනා කරන ලද ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් 2021-10-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත්, මහා සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත් සභාව වෙතින් ඉල්ලීම් කරන ලදී.

2021-10-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>(ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා සහ ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)</u>

පළාත් පාලන සහකාර කොමසාරිස් සමීර වික්‍රමසිංහ මහතා සහ අප ප්‍රාදේශීය සභාව සම්බන්ධව කටයුතු කරනු ලබන විමර්ශන නිලධාරි ඒ.එච්.එම්.එන්. උදයසිරි මහතා මහා සභා රැස්වීමේ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා සහභාගි වීම පිළිබඳව සිය සතුට ප්‍රකාශ කරන ලද ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් පසුගිය මහා සභා රැස්වීමට ඉදිරිපත් කරන ලද සභා වාර්තා දෙක සම්බන්ධව සිය විරෝධතාවය ප්‍රකාශ කරන ලද්දේ එම සභා වාර්තා දෙක සංක්ෂිප්තව ඉදිරිපත් කර තිබීම නිසා බවත්, සභා වාර්තා සම්බන්ධව සහ සභා රැස්වීම් සම්බන්ධව ඇති ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා කාරක සභා අවස්ථාවක් බවට පත් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>(ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)</u>

සභාවේ කටයුතු කරගෙන යාමට සහයෝගය ලබා දෙන ලෙසත්, සභා රැස්වීම අවසානයේදී කාරක සභාවක් බවට පත් කොට පළාත් පාලන සහකාර කොමසාරිස් සමීර වික්‍රමසිංහ මහතාට සහ විමර්ශන නිලධාරි ඒ.එච්.එම්.එන්. උදයසිරි මහතාට නිරීක්ෂණ දැක්වීම සඳහා අවස්ථාවක් ලබා දීම ප්‍රමාණවත් බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

(ගරු මන්ත්‍රිනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය සහ ගරු මන්ත්‍රිනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

නමුත් සභා වාර්තා පිළිබඳව ඇති ගැටළු නිරාකරණය කොට ගෙන සභා රැස්වීම කරගෙන යෑම සුදුසු බැවින් ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් කාරක සභා අවස්ථාවක් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කාරක සභා අවස්ථාවේදී පළාත් පාලන සහකාර කොමසාරිස් සමීර වික්‍රමසිංහ මහතා විසින් සහ විමර්ශන නිලධාරි ඒ.එච්.එම්.එන්. උදයසිරි මහතා විසින් ප්‍රාදේශීය සභා පනත සහ රැස්වීම් කටයුතු කරගෙන යාම පිළිබඳ කාර්ය පටිපාටික රීති අනුව මහා සභා රැස්වීමක් කරගෙන යාමේදී පිළිපැදිය යුතු කරුණු සම්බන්ධව සහ මහා සභා රැස්වීමක් වාර්තාකරණය කිරීමේදී අනුගමනය කළ යුතු කරුණු සම්බන්ධව සභාව දැනුවත් කරන ලදී. මීට අමතරව මේ සම්බන්ධව ගරු මන්ත්‍රීවරුන්ට තිබූ ගැටළුමය තත්ත්වයන් නිරාකරණය කර ගැනීමද මෙහිදී සිදු විය.

(ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා, ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා සහ ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉදිරියේදී සභා වාර්තාකරණයේ ඇති අඩුපාඩු අවම කර ගනිමින් වඩා හොඳ සභා වාර්තාවක් සකස් කිරීමට කටයුතු කරන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ගිය මහා සභාවට ඉදිරිපත් කරන ලද සභා වාර්තා දෙක යළි සකස් කොට සම්මත කිරීම සඳහා ඉදිරිපත් කරනවාද යනුවෙන් ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් විමසීම් කරන ලදී.

පසුගිය මහා සභා රැස්වීමට ඉදිරිපත් කරන ලද සභා වාර්තා දෙක සඳහා සංශෝධන හා නිවැරදි කිරීම් ඉදිරිපත් නොවූ බවත්, මහා සභා රැස්වීම පවත්වා සතියක් ඇතුළත ලිඛිත විරෝධතා ඉදිරිපත් නොවූ බවත්, සභා සම්මත වූ එම වාර්තා දෙක නැවත වරක් සභා සම්මත කිරීම සඳහා ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බවත්, සභාව දැනුවත් කරන ලද ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් 2021-10-15 දින පැවති මහා සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙස නැවතත් සභාව වෙතින් ඉල්ලා සිටින ලදී.

2021-10-15 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

කලේගාන වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු මේ වන විට කරගෙන යන බවත්, එහි ඉදිකිරීම් කටයුතු මාස නමයක කාලයක් ඇතුළත අවසන් කිරීමට බලාපොරොත්තු වන බවත්, සිට්ට්‍රස් වත්තේ ආදාහනාගාරය ඉදිකිරීම සඳහා අද දිනයේදී ගිවිසුම්ගත වන බවත්, එහි ඉදිකිරීම් කටයුතු ඉදිරියේදී ආරම්භ කරන බවත්, ආදාහනාගාරය ඉදිකිරීම සඳහා මුල්ගල් තැබීමේ උත්සවය ඉතා චාම්ව පැවැත්වීමට බලාපොරොත්තු වන බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම. ඃ- නැත**

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඃ- නැත**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා**

**01.** අප ප්‍රාදේශීය සභාවේ පෝද්දල උප කාර්යාලයේ ලේඛනාගාරය රාක්ක ගසා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** අප ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන හිරිඹුරගම සුමුදු පෙර පාසලේ සහ කලේගාන අරුණලු පෙර පාසල් ගුරු තනතුරු දෙක පුරප්පාඩු වීම නිසා කොන්ත්‍රාත් පදනම මත දේවමුණිගේ ඉමේෂිකා මධුෂානි පුෂ්පා කුමාරි මිය සහ යද්දෙහිවත්තගේ රුවනි මධුවන්ති මිය පෙර පාසල් ගුරු තනතුර සඳහා බඳවා ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සුමුදු පෙර පාසලේ පාලිකාව විශ්‍රාම ගිය බවත්, එම පෙර පාසලේ පෙර පාසල් පාලිකාවක් ලෙස පුහුණුව ලබමින් සිටි පෙර පාසල් පාලිකාව මේ වන විට එහි අධ්‍යයන කටයුතු සිදු කරගෙන යන බවත්, අරුණලු පෙර පාසලේ පෙර පාසල් පාලිකාව අසනීප තත්ත්වයෙන් පසු වන බැවින්, පෙර පාසල් පාලිකාවක් බඳවා ගෙන එහි අධ්‍යයන කටයුතු සිදු කර ගෙන යන බවත්, මෙම පෙර පාසල් පාලිකාවන් දෙදෙනාටම සභා අරමුදලින් ගෙවීම් කටයුතු සිදු නොකරන බවත්, කොන්ත්‍රාත් පදනම මත මෙම පෙර පාසල් පාලිකාවන් දෙදෙනා බඳවා ගැනීම සඳහා අනුමැතිය ලැබුණු පසු ගෙවීම් කටයුතු සිදු කරන බවත්, දැනට මෙම පෙර පාසල් පාලිකාවන් දෙදෙනා ස්වේච්ඡාවෙන් සේවය කරන බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** අප ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන හිරිඹුරගම සුමුදු පෙර පාසලේ සහ කලේගාන අරුණලු පෙර පාසල් ගුරු තනතුරු දෙක පුරප්පාඩු වීම නිසා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට අනුමැතිය ලැබෙන තුරු දේවමුණිගේ ඉමේෂිකා මධුෂානි පුෂ්පා කුමාරි මිය සහ යද්දෙහිවත්තගේ රුවනි මධුවන්ති මිය පෙර පාසල් ගුරු තනතුර සඳහා ස්වෙච්ඡා සේවයේ යෙදවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

පළමුව ස්වේච්ඡා පදනම යටතේ බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා ගෙන දෙවනුව කොන්ත්‍රාත් පදනම මත මෙම පෙරපාසල් පාලිකාවන් දෙදෙනා බඳවා ගැනීම සුදුසු බවට ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් විමසීම් කරන ලදී.

පළමුවෙන් බඳවා ගැනීමේ කටයුතු සඳහා අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය බවත්, ඒ වන තෙක් පෙර පාසල් දෙකෙහි අධ්‍යයන කටයුතු සිදු කිරීම සඳහා ස්වේච්ඡා පදනම මත සේවයේ යෙදවීම සඳහා ඔවුන් දෙදෙනා බඳවා ගන්නා බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** මොන්රෝවියා වත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයෙන් කාබනික පොහොර කිලෝ එකක් රු.8.00 බැගින් මෙට්‍රික් ටොන් 125ක්ද, මුදල් ගෙවීමකින් තොරව මෙට්‍රික් ටොන් 125ක්ද ලබා ගෙන කිලෝ 25 කාබනික පොහොර මලු 10,000ක් සකස්කර කාබනික පොහොර භාවිතය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මත කිරීම සඳහා සහයෝගයක් වශයෙන් අප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කෘෂිකර්මාන්තයේ යෙදෙන ජනතාවට සහ ගෙවතු වගාවේ නියතු ජනතාවට රු.200.00 ක සහන මිලට අලෙවි කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙමගින් සභාවට ලාභයක් නොමැති බවත්, ප්‍රජා සත්කාරයක් ලෙස මෙම කාබනික පොහොර කෘෂිකාර්මික කටයුතුවල නිරතවන ජනතාව වෙත සහන මිලට ලබා දෙන බවත්, වෙළඳපොලේ රුපියල් හයසීයක් පමණ වන කිලෝ 25 කාබනික පොහොර මල්ලක් රුපියල් දෙසීයක මිලට ලබා දෙන බවත්, එක් අයෙකුට මලු පහක් මිලදී ගත හැකි බවත්, ඊට වඩා මිලදී ගැනීමේ අවශ්‍යතාවයක් පවතින අයෙකුට ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් නිර්දේශ ලබා ගෙන මෙම කාබනික පොහොර මිලදී ගැනීම සඳහා හැකියාව ඇති බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.** අප ප්‍රාදේශීය සභාවේ සැලසුම් කමිටුව විසින් අනුමත කරන ලද ඉඩම් අනුබෙදුම්වලට අදාළ උද්ධෘත තාක්ෂණ සේවා නිලධාරීන්ගේ නිර්දේශ මත අනුමත කිරීමේ බලය ගරු සභාපතිතුමා වෙත පැවරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මූලික පිඹුර අනුමත කොට ඇති විට එහි උද්ධෘත අනුමත කිරීම සඳහා සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් නොකොට අනුමත කිරීම සඳහා මෙමගින් බලාපොරොත්තු වන බවත්, එමගින් උද්ධෘත අනුමත කිරීම සඳහා ගත වන කාලය අවම කර ගැනීමටත්, සැලසුම් කමිටුවේ නිවාස සැලසුම් අනුමත කිරීම සඳහා ඇති තදබදය අවම කර ගැනීම සඳහා බලාපොරොත්තු වන බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.** අප ප්‍රාදේශීය සභාවේ කලේගාන ප්‍රධාන කාර්යාලයේ සහ පෝද්දල උප කාර්යාලයේ මුර රාජකාරි පෞද්ගලික ආරක්ෂක ආයතනයක් හරහා ලබා ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ වන විට සභාවේ සේවකයන් හරහා මුර රාජකාරි ඉටු කළද, මේ සම්බන්ධව සභාපතිවරයා ලෙස තමා හට සෑහීමකට පත් විය නොහැකි බවත්, පෞද්ගලික අංශයෙන් මෙම සේවාව ලබා ගැනීමේදී අතිකාල දීමනා සහ බටා දීමනා ගෙවීමට අවශ්‍ය නොවන බැවින්, පෞද්ගලික අංශයෙන් මෙම සේවාව ලබා ගැනීම සභාවට වඩා ලාභදායක බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ස්ථිර මුරකරුවන් දෙදෙනා ඉදිරියේදී කුමන සේවාවන් සඳහා යෙදවීමට බලාපොරොත්තු වන්නේ දැයි සහ මුරකරුවන් වෙනත් රාජකාරී සඳහා යෙදවීමට බලය තිබේද යන බවත්, පත්වීම් ලියුමෙන් ලබා දී ඇති තනතුර වෙනස් කිරීමට හැකියාවක් තිබේද යනුවෙන් ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් විමසීම් කරන ලදී.

ස්ථිර මුරකරුවන් දෙදෙනා සභාවේ වෙනත් රාජකාරි සඳහා යොදවන බවත්, ඒ සඳහා ගැටළුවක් නැති බවත්, මුරකරු තනතුර ඉදිරියේදී අහෝසි වන බවත්, ඉදිරියේදී සම්පූර්ණයෙන්ම මුර රාජකාරි පෞද්ගලික අංශයෙන් ලබා ගන්නා බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

බොහෝ රාජ්‍ය ආයතන ටෙන්ඩර් කිරීම මගින් පෞද්ගලික අංශයෙන් ආරක්ෂක සේවාවන් ලබා ගන්නා බවත්, මුර තනතුරේ සේවකයන් බලහත්කාරයෙන් වෙනත් සේවාවල යෙදවිය නොහැකි බවත්, පෞද්ගලික අංශයෙන් මෙම සේවාව ලබා ගැනීමේදී සභාවේ සේවකයන් යොදවනවාට වඩා විශාල වියදමක් වැය වන බවත් ප්‍රකාශ කරන ලද ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් මුරකරුවන් සම්බන්ධව ගැටළු ඇතිවූ අවස්ථාවලදී විනය ක්‍රියාමාර්ග ගෙන තිබේද යනුවෙන් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් විමසීම් කරන ලදී.

ආයතන ප්‍රධානියා ලෙස සේවකයන් සේවයේ යෙදවීමේ බලය ඇත්තේ තමා වෙත බවත්, මුරකරුවන් සම්බන්ධව දිගින් දිගට ඇතිවූ ගැටළු විසඳීම සඳහා මෙම ක්‍රියාමාර්ගය ගන්නා බවත්, සේවකයන් සේවයෙන් පහ කිරීමට තමා බලාපොරොත්තු නොවන බවත්, එක මුරකරුවෙක් සඳහා පඩියට අමතරව පැය 150 ක අතිකාල දීමනා ගෙවූවද, නිරන්තරයෙන් නිවාඩු ගැනීම, බීමතින් රාජකාරියේ යෙදීම, රාජකාරි වෙලාවේදී නිදාගැනීම වැනි ගැටළු පවතින බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

තවත් සේවකයෙකුට අගතියක් සිදු නොවන ආකාරයෙන් මෙම යෝජනාව ක්‍රියාත්මක කරන ලෙස ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

මෙම යෝජනාව ක්‍රියාවට නැගීමේදී කිසිදු පාර්ශවයක් අගතියට පත් නොකරන බවත්, ස්ථිර සේවකයන්ගේ රැකියාව අහිමි නොකරන බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**07.** අප ප්‍රාදේශීය සභාවේ වසර දෙක ඉක්මවූ පහත දක්වා ඇති තැන්පත් මුදල් සභා ආදායමට ගැනීමට යෝජනා කරමි.

- ආරක්ෂක ඇප තැන්පත් රු. 51,645.00
- සාමාන්‍ය ඇප තැන්පත් රු. 628,623.50
- ටෙන්ඩර් ඇප තැන්පත් රු. 7,200.00
- කර්මාන්ත ඇප තැන්පත් රු. 66,996.32

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**08.** අප ප්‍රාදේශීය සභාවේ මේ දක්වා අයකර ගත නොහැකිව දීර්ඝකාලීන ණය ගැතියන් වශයෙන් ගිණුම්වල ඉදිරියට එන පහත සඳහන් ණය ශේෂ සහා ආදායමෙන් කපා හැරීමට යෝජනා කරමි.

- හිඟ හිටි මැතිවරණ රාජකාරි ගිණුම රු. 8,707.50
- හිඟ හිටි වරෙන්තු ගාස්තු හා උසාවි දඩ ගිණුම රු. 354,043.34
- හිඟ හිටි මුද්දර ගාස්තු ගිණුම රු. 3,280,433.44

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම මුදල් දකුණු පළාත් සභාවෙන් ලැබිය යුතු වුවත්, මේ වන තෙක් මේ මුදල් සභාව වෙත ලැබී නොමැති බවත්, අවුරුදු දෙකකට වඩා වැඩි මුදල් ගෙවීම් කිරීම සිදු නොකරන බැවින්, මෙම ණය ශේෂ පොත් වලින් කපා හැරීමට යෝජනා කළ බව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**09.** හැබිටාඩ් ශ්‍රී ලංකා නිවාස ව්‍යාපෘතිය යටතේ අඹගහවත්ත ග්‍රාම සේවා වසමේ පදිංචි එච්.කේ. අචලා උදයංගනී මහත්මියහට නිවසක් ඉදිකර ගැනීම වෙනුවෙන් භූමිය සකස්කර ගැනීමේ කටයුතු සඳහා මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව බැකෝ යන්ත්‍රය සහ සේවකයන් යෙදවීම අනුමත කරන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමාගේ යෝජනා</u>**

**10.** කපුහෙම්පල කිවුලදූව වත්ත මාර්ගයට අවහිර ලෙස සිටුවා ඇති දුරකථන කණු මාර්ගයට අවහිර නොවන පරිදි සිටුවන ලෙස ටෙලිකොම් ආයතනය දැනුවත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා සහ ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**11.** තොටගොඩ, අඹගහවත්ත ඉහළ මාර්ගයේ විපුල මහතාගේ නිවසට සහ එම මාර්ගයට අනතුරුදායක ලෙස ඇති අඹ ගස් දෙක සහා අරමුදලින් කපා ඉවත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**12.** පවතින අයහපත් කාලගුණ තත්වය නිසා හානි වී ඇති අඩු ආදායම්ලාභීන්ගේ නිවාසවල වහලවල් ඉදිකරගැනීම සඳහා ගරු දකුණු පළාත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව සෙවිලි තහඩු ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා සභා අරමුදල්වලින් ප්‍රතිපාදන ලබා දීමේ හැකියාවක් නොමැති බවත්, ගරු ආණ්ඩුකාරතුමාගෙන් මේ සඳහා අනුමැතිය ලැබුණ හොත් මෙම යෝජනාව ක්‍රියාත්මක කළ හැකි බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

වසරක් පාසා තම කොට්ඨාශය තුළ අඩු අදායම්ලාභීන් සඳහා නිවසක් ඉදිකර ලබා දීම තමාගේ මැදිහත් වීමෙන් සිදු කළ බවත්, තව ඉදිකළ යුතු නිවාස තුනක් පමණ පවතින නමුත් ඉඩමේ අයිතිය සම්බන්ධව ගැටළු ඇති නිසා රජයෙන් ලබා දෙන ප්‍රතිපාදන ලබා දීමේ ගැටළුවක් පවතින බවත්, එබැවින් ආණ්ඩුකාරතුමාගෙන් ප්‍රතිපාදන ලබා ගෙන මෙම කාර්යය සිදු කිරීම සඳහා ඉල්ලීම් කළ බවත්, මේ සඳහා සභා යෝජනාවක් ලබා ගෙන ආණ්ඩුකාරතුමා වෙත යොමු කරන ලෙස දැනුම් දුන් බවත් ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

රජයෙන් ඒ සඳහා මුදල් වෙන් කළ නොහැකි ගැටළුවක් තිබේ නම් සභාවෙන් ද මුදල් වෙන් කළ නොහැකි බවත්, මෙම යෝජනාව ගරු ආණ්ඩුකාරතුමා වෙත අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා යොමු කරන බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම නිවාසලාභීන් හට සිය දරුවන් සමඟ සතුටින් කාලය ගත කිරීම සඳහා මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම ප්‍රයෝජනවත් බවත්, තව නිවාස හතරක් තම කොට්ඨාශය තුළ ඉදිකිරීමට ඇති බවත් ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**13.** අක්මීමණ, කපුහෙම්පල, ශ්‍රී සුමංගලෝදයාරාම විහාරස්ථානයට හිමිකාරිත්වය ඇති ඊරියගස්දූව ඉඩමෙන් පර්චස් 10ක බිම් කොටසක් සහා අරමුදලින් මැන වෙන්කර කපුහෙම්පල ග්‍රාම නිලධාරි වසම සඳහා සේවා පියසක් ඉදිකිරීමට අප ප්‍රාදේශීය සභාවට හෝ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පවරා ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා බෞද්ධ කටයුතු අමාත්‍යාංශයේ නිර්දේශය ලබා ගත යුතු බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

බී.පී. අප්පුහාමි නැමැත්තෙකු විසින් පන්සල පවතින තුරා මෙම ඉඩම පන්සල සඳහා බදු දී ඇති බවත්, මෙම ඉඩමේ සේවා පියස ඉදිකිරීම සම්බන්ධව විහාරාධිපති හිමියන්ගේ කැමැත්ත ප්‍රකාශ කොට ඇති බවත් ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමාගේ යෝජනා</u>**

ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 14 වන යෝජනාව ඉල්ලා අස්කර ගන්නා ලදී.

**15.** අප සභාව මගින් පාලනය වන රාත්‍රියේ ක්‍රීඩා කළ හැකි ක්‍රීඩා පිටිවල ආලෝකකරණ පද්ධතිවල නඩත්තු කටයුතු හා අළුත්වැඩියා කටයුතු අප ප්‍රාදේශීය සභාව මගින් සිදු කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සභාව සතු පෝද්දල ක්‍රීඩාංගනය රාත්‍රියේදී ක්‍රීඩා කටයුතු සිදු කළ හැකි ලෙස සකස් කොට ඇති බවත්, නරාවල කාසල්වත්තේ ක්‍රීඩාංගනයද ඒ සඳහා සුදානම් කර ඇති බවත්, මෙම ආලෝකකරණ පද්ධතිවල නඩත්තු කිරීමේ ක්‍රමවේදයක් අවශ්‍ය බැවින්, සභාව මඟින් මේවා අළුත්වැඩියා කටයුතු සිදු කිරීම සුදුසු බවත් ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**16.** මුලන රුවන් මහතාගේ නිවස ඉදිරිපිට ඇති මාර්ගයේ කාණුව ක්‍රමවත්ව නොමැති බැවින් එම කාණුව ක්‍රමවත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම ඉඩමේ හිමිකරුවන්ද අදාළ කාර්ය සිදු කිරීම සඳහා සිය එකඟතාවය පළ කොට ඇති බවට, ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමාගේ යෝජනා**

**17.** හිරිඹුරගම ග්‍රාම නිලධාරි වසමේ, ජස්ටින් කන්ද ගම්මානයේ ප්‍රධාන මාර්ගයන්හි නායයෑම් සහිත ස්ථානයන් සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත දන්වා යැවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ ලිපියේ පිටපතක් එන්.බී.ආර්.ඕ. ආයතනයටද යොමු කිරීමට කටයුතු කරන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**18.** ගොඩකන්ද, සිරිපාල ලියනගේ මාර්ගයේ අතුරු මාර්ගය (ඕකන්ද වත්ත මාර්ගය) සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**19.** ඉන්ග්ලන්ඩ් හිල් අතුරු මාර්ගයේ බෝක්කුව සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම බෝක්කුවේ දෙපස බැම් දෙක පහත්ව පිහිටා ඇති බැවින්, ජල පහර බෝක්කුව උඩින් ගමන් කිරීම නිසා නිවාස දෙක තුනකට හානි සිදු වන බැවින්, බෝක්කුව දෙපස බැම් දෙක උස් කර සකස් කිරීම සඳහා යෝජනා කළ බවට, ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**20.** ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය හරහා ප්‍රතිපාදන වෙන්කරවාගෙන අප සභාව සතු සුදුසු ඉඩමක විශේෂ අවශ්‍යතා ඇති දරුවන් සඳහා අධ්‍යාපන කටයුතු සහ ක්‍රීඩා කටයුතු සිදුකළ හැකි පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අප ප්‍රාදේශීය සභාව මඟින් ඉඩමක් වෙන් කර ලබා දුන් පසු ගරු අමාත්‍ය පියල් නිශාන්ත මැතිතුමා විසින් මේ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දීමට තමා වෙත පොරොන්දු වූ බවට, ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**21.** ගොඩකන්ද, පරණගෙදරවත්ත ඉඩමේ (රියල් ප්ලේස්) සෞභාග්‍යා පෙර පාසලක් ඉදිකිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම අවස්ථාව අප ප්‍රාදේශීය සභාව වෙත ලබා දීම පිළිබඳව ගරු අමාත්‍ය රමේෂ් පතිරණ මැතිතුමා වෙත ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ස්තුතිය පළ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**22.** දීර්ඝකාලීන ගැටළුවක්ව පවතින කරාපිටිය, පන්විලදූව වත්ත මාර්ගයේ සහ විවේකාරාම මාර්ගයේ ජල ගැලුම් ගැටළුව අප ප්‍රාදේශීය සභාවෙන් මැදිහත් වී සහා අරමුදල් යොදවා විසඳීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම ජල ගැලුම් ගැටළුව විසඳීමට සුබසිංහ මහත්මියගේ නිවස අසළ ඇති කාණුව සහ විවේකාරාම මාර්ගයේ රණවිරු නිවස අසළ ඇති කාණුව සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙස ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**23.** පැල්පොලවත්ත, ජලජ පරිසර කලාපය ආශ්‍රිත ප්‍රදේශයට කැලි කසළ බැහැරලීම නැවැත්වීම සඳහා කසළ දැමීම තහනම් පුවරු සවිකිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව පුවරුවක් සවි කළේ කුමන ස්ථානයකද, යන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා වෙතින් විමසීම් කරන ලදී.

ගොඩකන්ද පාරේ කුණු ගෙනවිත් දමා තිබූ ස්ථානයක් තිබූ බවත්, සභාවේ ජේ.සී.බී යන්ත්‍රය උපයෝගී කරගෙන ඒ ආසන්නයේ ඇති ස්ථානයක එම කුණු ගොඩ වළලා දැමූ බවත්, ඉන් පසු එම ස්ථානයේ කසළ දැමීම තහනම් බවට පුවරුවක් සවි කළ බවත්, එම යෝජනාව සඳහන් ස්ථානයේ කසළ දැමීම තහනම් බවට පුවරුවක් සවි කිරීමට අමතරව අප ප්‍රාදේශීය සභාව මඟින් නඩත්තු කරන ජලජ ජීවී කලාපයක් බවට විශේෂයෙන් සඳහන් කරන ලද පුවරුවක් සවිකරන ලෙසත්, ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමාගේ යෝජනා</u>

**24.** උළුවිටිකේ, ලිද්දෙණියවත්ත මාර්ගයේ ගමනාගමනයට අපහසුතා ඇතිවන අයුරින් ඉදිකර ඇති අනවසර ඉදිකිරීම් සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදාගෙන කඩිනමින් ඉවත් කිරීමටත් ඒ සඳහා නීතිය ක්‍රියාත්මක කිරීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

නිවාස අටකට ගමන් කළ නොහැකි ආකාරයට පාර අවහිර වන පරිදි තාප්පයක් ඉදිකර ඇති බවත්, මේ සම්බන්ධව අප ප්‍රාදේශීය සභාව වෙත පැමිණිලි කර ඇති බවත්, මෙම මාර්ගය අප ප්‍රාදේශීය සභාව විසින් සංවර්ධනය කරන ලද මාර්ගයක් බවත්, මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

(ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

අදාළ අනවසර ඉදිකිරීම ඉවත් කරන ලෙස අප ප්‍රාදේශීය සභාව මඟින් දැනුම් දී ඇති බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙම අනවසර ඉදිකිරීම ඉවත් කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන ලෙස මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**25.** බෝපෙ උතුර, මුත්තෙට්ටුවේ වත්ත මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**26.** ගාල්ල, බෝපෙ, එගොඩකනත්තවත්ත ලිපිනයේ පදිංචි නීලා ශාන්ති මහත්මියගේ ඉඩමේ පස් කණ්ඩිය කැපීමට අදාළ ගැටළුව විසඳීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම ස්ථානයේ අඩි දොළහක් පමණ උස පස් කණ්ඩිය වසර දහයක පමණ කාලයක් තිස්සේ දිගින් දිගටම කැපීම සිදු කරන බවත්, මෙම සිද්ධිය පිළිබඳව සභාව වෙත පැමිණිලි කර වසර දහයක පමණ කාලයක් ගත වී ඇති බවත්, විටින් විට මෙම ක්‍රියාව සම්බන්ධව සභාව දැනුවත් කර ඇති බවත්, මේ වන විට ඒ ආසන්නයේ ඇති නිවාස සඳහා හානිදායක තත්ත්වයක් ඇති බවත්, මේ සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත්, එම පස් කණ්ඩිය කැපීම සිදු කරන ලද පාර්ශවය විසින් ඒ සඳහා බැම්මක් ඉදි කළ යුතු බවත්, මේ ගැන දිගින් දිගට පැමිණිලි කළද, විසඳුම් ලැබී නොමැති බවත් මෙම ප්‍රශ්නය මුළු බෝපෙ පෝද්දල බල ප්‍රදේශයේම ඇති බවත් ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙම පස් කණ්ඩිය කැපූ පාර්ශවය හෝ මෙම දෙපාර්ශවයම එකතු වී අදාළ පැති බැම්ම ඉදිකළ යුතු බවත්, දෙපාර්ශවයේ එකඟතාවයෙන් පස් කණ්ඩි කැපීම සිදු කරන බවත්, දෙපාර්ශවයේ අමනාප වීම් ඇති වූ විට මෙම ප්‍රශ්න ප්‍රාදේශීය සභාව වෙත යොමු කළද, මෙම ගැටළු සඳහා සභා අරමුදලින් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාවක් නොමැති බවත්, සභාව සාක්ෂිකාරයෙකු කොට පෞද්ගලිකව අධිකරණ ක්‍රියාමාර්ග ගත යුතු බවත්, බැම්ම ස්ථාවර කරන ලෙස අදාළ පස් කණ්ඩිය කැපීම සිදු කළ පාර්ශවය වෙත දන්වා යවා ඇති බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

අදාළ දෙපාර්ශවය කැඳවා මෙම ප්‍රශ්නය විසඳන ලෙස ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

අදාළ ගැටළුව සම්බන්ධව වැඩිදුරටත් සභාව දැනුවත් කිරීම සඳහා ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කාරක සභා අවස්ථාවක් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කාරක සභා අවස්ථාවේ තාක්ෂණ නිලධාරිනි අයි.ඩී. කමණී චන්ද්‍රලතා මිය විසින් 2013 වර්ෂයේ සිට මෙම පස් කණ්ඩිය කැපීම සම්බන්ධ ගැටළුව අප ප්‍රාදේශීය සභාව වෙත යොමු වී ඇති බවත්, ඒ සඳහා පස් කණ්ඩිය කපන ලද පාර්ශවය වෙත ආරක්ෂිත පැති බැම්මක් යොදන ලෙස දැනුම් දීම සිදු කර ඇති බවත් සභාව දැනුවත් කරන ලදී.

කාරක සභා අවස්ථාවේදී විමර්ශන නිලධාරි ඒ.එච්.එම්.එන්. උදයසිරි මහතා විසින් පස් කණ්ඩි කැපීමේදී ප්‍රාදේශීය සභාව මැදිහත් විය යුතු ආකාරය පිළිබඳව සභාව දැනුවත් කරන ලදී.

කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම ගැටළුව පිළිබඳව භූ විද්‍යා හා පතල් කාර්යංශය දැනුවත් කරන ලෙසත්, ජනතාවගේ ගැටළු වෙනුවෙන් ප්‍රාදේශීය සභාව ලෙස මීට වඩා මැදිහත් වීමක් සිදු කරන ලෙස ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

අනවසර ඉදිකිරීම් හා ගොඩකිරීම් සම්බන්ධව නැවැත්වීම සිදු කරන ලෙස සභාව විසින් දැනුම් දුන්නද, අදාළ කටයුතු නැවැත්වීම සිදු නොකරන බැවින් මේ සඳහා අධිකරණයෙන් තහනම් නියෝග ලබා ගත යුතු බවත්, නමුත් මේ සඳහා විශාල නීතිඥ ගාස්තුවක් වැය වෙන බැවින්, තහනම් නියෝග ලබා ගැනීම සඳහා නීති නිලධාරියෙකු බඳවා ගන්නා ලෙසත්, නැතහොත් තහනම් නියෝග ලබා ගැනීම සඳහා සභාවේ නිලධාරියෙකු පත් කරන ලෙසත් ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

අදාළ ගැටළුව සම්බන්ධව වැඩිදුරටත් සභාව දැනුවත් කිරීම සඳහා ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කාරක සභා අවස්ථාවක් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කාරක සභා අවස්ථාවේදී විමර්ශන නිලධාරි ඒ.එච්.එම්.එන්. උදයසිරි මහතා විසින් නිලධාරීන්ට අධිකරණයෙන් තහනම් නියෝග ලබා ගැනීමේදී ගැටළුකාරී තත්ත්වයන් පැන නැගිය හැකි බැවින්, සභාවේ අධිකරණ කටයුතු සඳහා ටෙන්ඩර් කොට යම්කිසි නිශ්චිත කාලයක් සඳහා නීතිඥයෙකු බඳවා ගැනීමට

හැකියාව ඇති බවත්, අනවසර ඉදිකිරීම් සම්බන්ධ නඩුව සභාව ජයග්‍රහණය කළ පසු ඒ සඳහා වැය වූ නඩු ගාස්තු අය කර ගැනීමේ හැකියාව ඇති බවත් සභාව දැනුවත් කරන ලදී.

කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩබ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(තේ පානය සඳහා සභාව කල් තබන ලදී)**

(ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා සහ ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමාගේ යෝජනා**

**27.** කිතුලම්පිටිය කොට්ඨාශය සඳහා වීදි පහන් කට්ටල 50ක් මිලදී ගැනීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම වර්ෂය සඳහා වීදි පහන් නඩත්තු කටයුතු සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන අවසන් බැවින්, ඊළඟ වර්ෂයේදී වීදි පහන් කට්ටල මිලදී ගෙන කොට්ඨාශ මට්ටමින් සවි කිරීමේ කටයුතු සිදු කරනු ලබන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**28.** කිතුලම්පිටිය ප්‍රජා ශාලා ගොඩනැගිල්ලට නල ජල පහසුකම් ලබා දීමට යෝජනා කරමි.

අදාළ ප්‍රජා ශාලා ගොඩනැගිල්ල පිහිටි භූමිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු බැවින්, නල ජල පහසුකම් ලබා දීම සඳහා සභා අරමුදල් වැය කළ නොහැකි බවටත්, එම භූමිය සභාවට පැවරීමෙන් පසු අදාළ කාර්යය සිදු කළ හැකි බවටත්, සභාව දැනුවත් කරන ලදී.

ඉහත යෝජනාව ස්ථිර කිරීමක් සිදු නොවූ බැවින්, සභා සම්මත නොවීය.

**29.** රත්නගිරිවත්ත, පැලවත්ත පොදු සුසාන භූමිය අප ප්‍රාදේශීය සභාවට පවරාගෙන මායිම් වැට ඉදිකිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම යෝජනාව කාලෝචිත බවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දන්වා එම යෝජනාව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**30.** අබේසුන්දරවත්ත, ඩබ්.කේ. රජීව මහතාගේ නිවස අසළ මාර්ගය අප සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදවා සුදුසු පරිදි සකස්කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**31.** පලාගල කන්ද ඉහළ මාර්ගයේ සිට පහළ මාර්ගය දක්වා වූ කාණු පද්ධතිය අප ප්‍රාදේශීය සභාවේ යන්ත්‍ර සූත්‍ර හා සේවකයන් යොදා කැපීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

පස් කණ්ඩි කඩා වැටීම් නිසා අනතුරුදායක තත්ත්වයක් නිර්මාණය වී ඇති බැවින්, එක්ස්කැවේටර් යන්ත්‍රයක් සහ සභාවේ සේවකයන් යොදා ගෙන කඩිනමින් මෙම කාර්යය සිදු කළ යුතු බවට ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමාගේ යෝජනා</u>**

**32.** මිහිඳු මාවතේ, අඹගහවත්ත අතුරු මාර්ගයේ ඉතිරි කොටස සංවර්ධනය සඳහා කලේගාන දකුණ පුබුදු ග්‍රාම සංවර්ධන සමිතිය සමග ගිවිසුම්ගත වුවද කොරෝනා වසංගතය පැතිරීම නිසා සංවර්ධන කටයුතු ගිවිසුම් කාලසීමාව තුළ සිදු කිරීමට නොහැකිවීම හේතුවෙන් එම ගිවිසුම හා ඇස්තමේන්තුව අවලංගු කොට නව ඇස්තමේන්තුවක් සකස්කර මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**33.** මිහිඳු මාවතේ, ලාවලුගහ අතුරු මාර්ගය සහා අරමුදලින් මැන මායිම් ලකුණු කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**34.** නාගරුක්ඛාරාම මාවතේ ඇළට මායිම් වන පැති බැම්ම සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**35.** මිහිඳු මාවතේ, දකුණතින් ඇති අතුරු පාරේ බෝක්කුව හරහා වතුර බැසිය හැකි ආකාරයට සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම ඇළ මාර්ගය වාරිමාර්ග දෙපාර්තමේන්තුව සතු වුවද, මාර්ගය සභාව සතු නිසා පැති බැම්මක් ඉදිකිරීමේ අවශ්‍යතාවයක් ඇති බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමාගේ යෝජනා</u>**

**36.** පාසල් වාරය ආරම්භවීමත් සමග කොවිඩ් උවදුර උත්සන්න වී ඇති බැවින් අප බල ප්‍රදේශයේ ඇති සියළු පාසල් සතියකට වරක්වත් විෂබීජහරණය කරදෙන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම යෝජනාව කාලෝචිත යෝජනාවක් බවත්, විෂබීජහරණ කටයුතු සිදු කිරීම අනවශ්‍ය බවට සභාව දැනුවත් කොට ඇති බවත්, පාසල් විජබීජහරණය අධ්‍යාපන අමාත්‍යාංශය සිදු කළ යුතු කාර්යයක් බවත්, බලප්‍රදේශය තුළ ඇති සියළුම පාසල් විජබීජහරණය සිදු කිරීම සභාව මැදිහත් වීමෙන් සිදු කළ නොහැකි බවත්, වසා තිබූ පාසල්වල කොරෝනා වෛරසය පැවතීමට ඉඩ නොහැකි බවත්, සභාවේ විජබීජහරණ කටයුතු සඳහා ප්‍රතිපාදන සීමාවල් තිබෙන බවත්, දැනට විදුහල්පතිවරු විජබීජහරණ කටයුතු සඳහා ඉල්ලීම් කර නොමැති බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

දැනට පාසල්වල මෙම උවදුර ව්‍යාප්ත වන බැවින්, මෙම යෝජනාව සිදු කළ බවත්, බලප්‍රදේශයේ පාසල් පිළිබඳව අවධානය යොමු කරන ලෙසත් ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

පසුගිය කාලය තුළදී දෙමව්පියන්ගේ මැදිහත්වීමෙන් පාසල් පිරිසිදු කිරීමේ කටයුතු සිදු කළ බවත්, මෙම කාර්යය ඉෂ්ට කිරීම සඳහා අවශ්‍ය කාර්යය මණ්ඩලය පාසල් සතු බවට ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

( ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සහ ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**37.** කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයේ ක්‍රීඩා භූමියේ හා පාසල අවට ඇති තණකොළ කපා ඉවත් කරන ලෙස යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගියවර ක්‍රීඩාපිටියේ තණකොළ කැපීම සඳහා ප්‍රදේශවාසීන්ට රුපියල් එකොළොස් දහසක පමණ මුදලක් වැය වූ බවත්, එම නිසා සභාව මැදිහත්වීමෙන් එම කාර්යය ඉටු කිරීම සඳහා යෝජනා කළ බවට ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙම කාර්යය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් සිදු කළ යුතු කාර්යයක් වන නමුත් විදුහල්පතිතුමා විසින් මේ සම්බන්ධව ඉල්ලීමක් කළ හොත් ඒ සඳහා මැදිහත් විය හැකි බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

## ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමාගේ යෝජනා

**38.** දීගොඩ වෙල්ලාලගොඩවත්ත මාර්ගයේ නායගොස් ඇති ස්ථානය සඳහා පැති බැම්මක් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**39.** දීගොඩ වෙල්ලාලගොඩවත්ත මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම සංවර්ධන කටයුත්ත සිදු කිරීම සඳහා ප්‍රදේශවාසීන්ගේ සහ ඒ සඳහා විරෝධතාවය පළ කළ පාර්ශවයන්ගේ එකඟතාවය මේ වන විට පළ කර ඇති බැවින්, මෙම සංවර්ධන කටයුත්ත ඉක්මනින් ඉටු කරන ලෙස ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 2021-10-15 දින පැවති මහා සභා රැස්වීමේදී කල් තබන ලද යෝජනා

## ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමාගේ යෝජනා

ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා සභා ගර්භයෙන් පිටවී ගිය බැවින්, එම යෝජනාව තමා විසින් ඉදිරිපත් කරන ලද බවට, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

**17.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සියළුම ගරු මන්ත්‍රීතුමන්ලාට සහ ගරු මන්ත්‍රීතුමියන්ලාට ප්‍රාදේශීය සභාවේ වැදගත් ලිපිගොනු ගෙනයාම සඳහා සුදුසු කාර්යාල බෑගයක් සභා අරමුදලින් ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම යෝජනාව පිළිබඳ පළාත් පාලන කොමසාරිස්තුමාගේ උපදෙස් ලබා ගෙන අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමාගේ යෝජනා</u>**

**28.** කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් අඩාලව ඇති ළමා අධ්‍යාපන කටයුතු සඳහා අත්වැලක් සැපයීම වෙනුවෙන් බල ප්‍රදේශයේ පුස්තකාල පහසුකම් අඩු පාසල් සඳහා සභාවේ මැදිහත්වීමෙන් ජංගම පුස්තකාල සේවයක් ඇති කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

( ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

කොවිඩ් අවදානම නැවත ඉස්මතු වී ඇති බැවින්, පාසල් වල අධ්‍යාපන කටයුතු අවදානම් තත්ත්වයක පැවතීම හේතුවෙන් සභාව සතු සම්පත් අවශ්‍ය කළමනාකරණයක් සිදු කොට මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම වැදගත් බවට ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**29.** කොවිඩ් 19 වසංගතය පැතිරීම හා මරණ සාපේක්ෂව යම් අඩුවක් පැවතුනද රට විවෘත කිරීම තුළ ජන සමාජය සාමාන්‍ය පරිදි සාමූහික සමාජ ආර්ථික ක්‍රියාකාරකම් වල නිරත වීම හේතුවෙන් ඉදිරියේදී නැවත කොවිඩ් 19 වසංගතය පැතිරීමට ඇති ඉඩකඩ හා අවදානම පෙර ලෙසම පවතී. එබැවින් බල ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂාව වෙනුවෙන් කොවිඩ් 19 වසංගතය පරාජය කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක් ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය සම්බන්ධ කර ගනිමින් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් ඉල්ලීම් කරන ලද සෑම අවස්ථාවකම සභාව විසින් ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබා දී ඇති බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ඉදිරියේදී තව අවශ්‍යතා මතු වුවහොත් ඒ සඳහා මැදිහත් වෙන ලෙස ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**30.** මේ වන විට සියළුම අධ්‍යාපන කටයුතු මාර්ගගත (Online) ක්‍රම ඔස්සේ සිදුකරනු ලබන අතර අදාළ පහසුකම් වල ඇති දුර්වලතා හා අවහිරතා හේතුවෙන් ඒ සඳහා විවිධ බාධාවන් පවතී. මේ සම්බන්ධව තොරතුරු විශ්ලේෂණය කර අදාළ අමාත්‍යංශය හා ආයතන සම්බන්ධීකරණය කර ගනිමින් මෙකී බාධාවන් ඉවත් කිරීමට සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාවට නැගීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

විදුලි සංදේශ ආයතන කිහිපයක් තිබුණද බහුතරයක් ප්‍රදේශවලට අන්තර්ජාල පහසුකම් ලබා ගැනීමේදී අපහසුතා මතු වී ඇති බවත්, මෙම තාක්ෂණය යොදා ගැනීම සඳහා සන්නිවේදන ජාලවල ධාරිතාවයන් ප්‍රමාණවත් නොමැති බවත්, සන්නිවේදන කුළුණුවල ඇති අවහිරතාවයන් හේතුවෙන් සංඥා සම්බන්ධව ගැටළු ඇති බවත්, අදාළ අමාත්‍යාංශ මට්ටමින් මේ සඳහා අදාළ ආයතන දැනුවත් කරන ලෙසත් ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙය ජාතික මට්ටමින් සිදු කළ යුතු කාර්යයක් බවත්, සම්ප්‍රේෂණ සීමාවන් වැඩි දියුණු කිරීම සඳහා දුරකථන සන්නිවේදන සමාගම් විසින් කුළුණු ඉදිකිරීමට සැලසුම් කළද, මහජන විරෝධතා සහ මහජන නියෝජිතයන්ගේ විරෝධතා හමුවේ එම කාර්යයන් නැවැත්වීමට සිදු වන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

( ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

අන්තර්ජාලය භාවිතා කිරීමේදී සංඥා බාධාවන් ඇති බැවින්, ශිෂ්‍යයන්ට, ගුරුවරුන්ට හා අනෙකුත් දේශකවරුන්ට බාධාවන් ඇති බැවින්, මේ සම්බන්ධව පියවරක් ගන්නා ලෙස ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**31.** බල ප්‍රදේශය තුළ පුස්තකාල පහසුකම් ව්‍යාප්ත කිරීම සඳහා තොටගොඩ, කපුහෙම්පල, ලබුදූව ප්‍රදේශ ආශ්‍රිතව නව පුස්තකාල ශාඛාවක් ඇති කිරීමට කටයුතු කරන මෙන් මෙම ගරු සභාවට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කලේගාන හා පෝද්දල පුස්තකාල දෙක වැඩිදියුණු කරමින් මෙම ප්‍රදේශයන් ආවරණය වන පරිදි පුස්තකාලයක් ඉදිකිරීමේ අවශ්‍යතාවය මතුව ඇති බවට ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මේ සඳහා ඉඩමක අවශ්‍යතාවය, ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ අවශ්‍යතාවය සහ සේවකයන් බඳවා ගැනීමේ ගැටළු ඇති බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

තොටගොඩ ග්‍රාම සේවා වසමේ සිරිධම්ම මාර්ගයේ ඉඩමක් මේ සඳහා ගරු ඇමතිතුමාගේ මැදිහත්වීමෙන් වෙන් කර ඇති බවත්, නමුත් සේවකයන් බඳවා ගැනීමේ ගැටළුව පැන නගින බවත් ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

සේවකයන් බඳවා ගැනීම සඳහා අනුමැතිය නොලැබුණහොත් තාවකාලික පදනම මත මේ සඳහා බඳවා ගැනීමේ කටයුතු සිදු කළ යුතු බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමාගේ යෝජනා</u>**

**36.** සභාවේ මහජන නියෝජිතයන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද යෝජනා සම්බන්ධව ගන්නා ලද ක්‍රියාමාර්ග ඊළඟ සභාවාරයේදී ඉදිරිපත් කළ යුතු අතර, යම් ආයතනයකට හෝ පුද්ගලයෙකුට ලිපි මගින් දන්වන්නේ නම් එම ලිපියේ පිටපතක් අදාළ යෝජනාව ඉදිරිපත් කළ මහජන නියෝජිතවරයාට ලබා දිය යුතු යැයි යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

තමා දැනුවත්ව මෙම කාර්යය සිදු වන බවටත්, එය එසේ නොවෙනවානම් ඉදිරියේදී එය නිවැරදි කිරීම සඳහා තමා මැදිහත් වන බවටත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ගොඩගැහෙන යෝජනාවලට ගනු ලබන ක්‍රියාමාර්ග ඊළඟ සභාවේදී ලබා දෙන ලෙස ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

( ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**37.** සංඥා කුළුණු ඉදිකිරීම සඳහා අවසර දීමේදී රෝහල්, පාසල් සහ අවට ජනතාවගේ කැමැත්ත (පනත ප්‍රකාරව) පිළිබඳ කොන්දේසිය උල්ලංඝනය කිරීමට ඉඩ නොතබන ලෙසත්, මොනම හේතුවක් නිසාවත් ප්‍රාදේශීය සභාවේ අනුමැතියකින් තොරව අවසර ලබා ගන්නා ආයතනයට හැර වෙනත් කිසිදු ආයතනයකට පරිහරණය කිරීමට ඉඩ නොදිය යුතු යැයි යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව පනතක් තිබුණද මෙම අඩුපාඩුව තවමත් දක්නට ඇති බවත්, දියුණු රටවල් මේ සඳහා සැටලයිට් තාක්ෂණය යොදා ගන්නා බවත්, විශාල ආදායම් ලබන දුරකථන පහසුකම් සපයන ආයතන සභාවට ගෙවනු ලබන්නේ පොඩි මුදලක් වූ නමුත් දුරකථන කුළුණු අතුරු බදු දීමෙන් එම ආයතන විශාල ආදායමක් ලබන බවත්, එමගින් සභාවට හිමිවිය යුතු ආදායම අහිමි වී ඇති බවත් ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

පනත අනුව එක් දුරකථන කුළුණකින් සභාවට අය කළ හැකි මුදල රුපියල් තුන්දාහක් බවත්, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අනුමැතිය යටතේ මෙම දුරකථන කුළුණු අතුරු බදු දීම සිදු කරන බවත්, මේ සම්බන්ධව විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව දැනුවත් කළද, සභාවට ලබා ගත හැකි උපරිම ආදායම රුපියල් තුන්දහසක් පමණක් බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

දුරකථන කුළුණු ඉදිකිරීමේදී අතුරු බදු දීම වැළැක්වීම සඳහා ගිවිසුමට කොන්දේසි ඇතුළත් කළ යුතු බවට ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**38.** මේ සමග ඇමුණුම් වශයෙන් ඉදිරිපත් කරනු ලබන සභාවාරවලදී මා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා අතර කොටු සළකුණ යොදා ඇති යෝජනා සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග ලිඛිතවම සභාගත කරන මෙන් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම යෝජනාව ඉදිරිපත් කිරීමට හේතු වූයේ තමා විසින් පෙර සභාවලට ඉදිරිපත් කරන ලද යෝජනා සම්බන්ධව ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳව දැනුවත් නොකිරීම නිසා බව ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනා සම්බන්ධව ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව ඉදිරියේදී සභාව ඉදිරිපත් කරන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමාගේ යෝජනා</u>**

**41.** හපුගල පවතින ආයුර්වේද මධ්‍යස්ථානය සඳහා වෛද්‍යවරයෙකු ලබා ගැනීමට වහාම කටයුතු කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කීපවරක්ම තමා විසින්ද මේ සම්බන්ධව ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බවත්, ඉදිරියේදී ස්ථාන මාරුවීම්වලදී සභාවේ නිලධාරීන් නිදහස් කරනුයේ අනුප්‍රාප්තිකයාගේ පැමිණීමෙන් පසුව බවත්, මේ වන විට එක ආයුර්වේද වෛද්‍යවරයෙකු මධ්‍යස්ථාන දෙකෙහිම සේවය කරන බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

බල ප්‍රදේශයේ වැඩිපුරම රෝගීන් පැමිණෙන ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය හපුගල ආයුර්වේද මධ්‍යස්ථානය වෙත මේ වන විට ස්ථිර ආයුර්වේද වෛද්‍යවරයෙකු නොමැතිවීමේ අඩුපාඩුව තදින් බලපා ඇති බැවින් මෙම ගැටළුව විසඳීම සඳහා කඩිනමින් මැදිහත් වන ලෙස ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**42.** කලේගානේ පැවති පොළ භූමිය සංවර්ධන කටයුත්තක් සඳහා යොදාගෙන ඇති බැවින් ප්‍රදේශවාසීන්ගේ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ඉතා ඉක්මනින් පොළ භූමියක් සකස්කර මහජනතාව සඳහා විවෘත කිරීමට කටයුතු කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙය කාලීන වශයෙන් දැඩි අවශ්‍යතාවයක් බවත්, එළවළුවල හිඟතාවයක් මේ වන විට ඇති බැවින් අතරමැදියන්ගේ ගැටළු නිසා ආර්ථික මධ්‍යස්ථානවලට වඩා වැඩි මිලකට එළවළු අලෙවි කරන බවත්, පොළ නිසා බල ප්‍රදේශයේ පාරිභෝගික ජනතාව වෙත විශාල සේවයක් ඉටුවන බැවින් පොළ ඉදිකිරීමේ කටයුතු කඩිනම් කරන ලෙස ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

සංවර්ධන කටයුත්තක අවශ්‍යතාවය හේතුවෙන් කලේගාන පොළ ඉවත් කළ බවත්, ලැන්දෑවේ පිහිටි මහා බෝධි සමාගම සතු ඉඩම සභාවට අත්පත් කරගෙන පොළ ඉදිකිරීම සඳහා කටයුතු කරන බවත්, එතෙක්

වක්වැල්ල ප්‍රදේශයට පොළ රැගෙන යාමට ඇති හැකියාව පිළිබඳව ඉදිරියේදී තීරණයක් ගන්නා බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් අද දින මහා සභා රැස්වීමට සහභාගි විය නොහැකි බවට දැනුම් දී තිබූ ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමාට සහ ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය වෙත නිවාඩු අනුමත කිරීමට කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**<u>(ඊ) කාරක සභාවල වාර්තා ඃ-</u>**

**01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව ඃ-**

**I.** 2021-11-01 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. තාක්ෂණික සේවා කමිටුව ඃ-**

**I.** 2021-11-01 දින පැවති තාක්ෂණික සේවා කමිටුව

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව ඃ- නැත**

**04. පරිසරය සහ පහසුකම් කමිටුව ඃ- නැත**

**<u>(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-</u>**

**<u>01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ</u>**

2021 වර්ෂයේ ඔක්තෝම්බර් මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ</u>**

2021 වර්ෂයේ ඔක්තෝම්බර් මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව</u>**

2021 වර්ෂයේ ඔක්තෝම්බර් මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>04. වෙනත් ලේඛන</u> ඃ- නැත**

(උ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා

පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය

2021 වර්ෂයේ නොවැම්බර් මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය සමාලෝචනය.

සිට්ට්‍රස් වත්තේ ආදාහනාගාරය ඉදිකිරීම සම්බන්ධව තමා විසින් අද දිනයේදී ලිපියක් සභා ගත කළ බවත්, ආදාහනාගාරයේ ටෙන්ඩර් ප්‍රදානය සම්බන්ධව තමා විසින් පසුගිය මුදල් කමිටුවේදී විරෝධතා ඉදිරිපත් කළ නමුත් ආදාහනාගාරය ඉදිකිරීමට තමාගේ විරෝධතාවයක් ඇති බවට වැරදි මතයක් ජනතාව වෙත ලබා නොදෙන ලෙසත් තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ මත අඩුම ලංසුව ඉදිරිපත් කර ඇති ආයතනය වෙත ටෙන්ඩරය ලබා දෙන ලෙසත් මේ සම්බන්ධව අධිහාර ගෙවීම්වලට යාමට ඉඩ නොතබන ලෙසත් ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

(ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

අදාහනාගාරය ඉදිකිරීම සම්බන්ධව ටෙන්ඩර් මණ්ඩලය අවසාන තීන්දුවක් ගත් බවත්, ආදාහනාගාරය ඉදිකිරීම සඳහා නැවත ටෙන්ඩර් කිරීමට සභා තීරණයක් ලබා ගත් බවත්, එම සභා තීරණයද, නැවත විධිමත් කිරීමකට ලක් කොට ලබා ගත් බවත්, අඩුම ටෙන්ඩරය ඉදිරිපත් කර ඇති ආයතනය විසින් තවලම ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය ඉදිකර ඇති නමුත් පසු සේවා සැපයීම සඳහා මාස හතක් යනතුරු පැමිණ නැති බවත්, අදාළ ආයතනයට අප්ග්‍රාෆ්ට් තාක්ෂණයට ආදාහනාගාර ඉදිකිරීම සම්බන්ධව සුදුසුකම් නැති බැවින්, නැවත විධිමත් ආකාරයට ටෙන්ඩර් කැඳවූ බවත්, නර්ඩ් ආයතනයේ ආදාහනාගාර ඉදිකිරීම සඳහා ලියාපදිංචි සියළු ආයතන වෙත දැනුවත් කළ බවත්, ආදාහනාගාර ඉදිකිරීමේ ව්‍යාපෘතිය දීර්ඝකාලීන ව්‍යාපෘතියක් බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ආදාහනාගාර නිරීක්ෂණ කටයුත්තට සහභාගි වන විට තමාට අප්ග්‍රාෆ්ට් තාක්ෂණය පිළිබඳව දැනුමක් නොතිබූ බවත්, කැඳවූ දෙවන ටෙන්ඩරයේ අප්ග්‍රාෆ්ට් තාක්ෂණයට ආදාහනාගාර ඉදිකිරීම සම්බන්ධව වසර පහක පළපුරුද්ද ඉල්ලා සිටීම අනෙකුත් ආයතන වලට අසාධාරණ බවත්, ප්‍රේමදාස සහ පුත්‍රයෝ ආයතනයේ මූල්‍ය හැකියාව පිළිබඳ තොරතුරු ටෙන්ඩරය සමඟ ඉදිරිපත් කර නොතිබූ බවත්, ආදාහනාගාර කුටීරය ඉදිකිරීම නියමිත ප්‍රමිතියට ඉදිකළ යුතු බවත්, නර්ඩ් ආයතනය විසින් එක් නිරීක්ෂණ ගමනකට විශාල මුදලක් අය කරන බවත්, ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

සිට්ට්‍රස් වත්තේ ආදාහනාගාරය ඉදිකිරීමට අදාළ ටෙන්ඩර් කටයුතු සම්බන්ධව ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා හට ඕනෑම ක්‍රියාමාර්ගයක් ගැනීමට හැකියාව ඇති බවත්, ටෙන්ඩර් ප්‍රදානය සම්බන්ධව අවසාන තීන්දුව ලබා ගත්තේ ටෙන්ඩර් මණ්ඩලය බවත්, තාක්ෂණ ඇගයීම් කමිටුවෙන් ලබා ගත්තේ නිර්දේශ පමණක් බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ආදාහනාගාර ඉදිකිරීමට අදාළ පුවත්පත් දැන්වීම් දෙකෙහිම ලංසු පිරිනැමීමේ කාලය ලෙස දින අනූවක කාලයක් සඳහන්ව ඇති බැවින්, මේ සම්බන්ධව ලංසු පිරිනැමීමේ කාලය අවසන් බවට ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

( ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

කොරෝනා වසංගතය ව්‍යාප්ත වීම නිසා සහ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් මේ සම්බන්ධව පරීක්ෂණයක් සිදු කිරීම නිසා ටෙන්ඩර් ප්‍රදානය සඳහා කල් ගත වීම සිදු වූ බවත්, ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා පෝද්දල ප්‍රදේශයේ ආදාහනාගාරයක් ඉදිකිරීම සඳහා යෝජනා කළ විටද, මෙය නොකිරීමට අවශ්‍යතාවයක් ඇති බැවින්, ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් විරෝධතාවය පළ කළ බවද, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

(සභාව ඝෝෂාකාරි විය.)

බල ප්‍රදේශය තුළ ඇති දිවා කාලයේදී දැල්වෙන වීදි පහන් නොදන්වා ඉවත් කරන ලෙසත්, ජල සැපයුම් ලබා දීමේදී මාර්ග පළුදු කරන බැවින් එම ස්ථාන අළුත්වැඩියා කිරීම සඳහා ප්‍රීමික්ස් ව්‍යාපෘතිය නැවත ආරම්භ කරන ලෙසත්, කපුහෙම්පල සෞඛ්‍ය සායන මධ්‍යස්ථානයේ ඉහළ මහළ සඳහා විදුලිය ලබා දීම ප්‍රමාද වී ඇති බැවින්, ඒ සඳහා මැදිහත් වන ලෙසත්, කපුහෙම්පල මාර්ගයන් අවට කුණු දමන ස්ථානවල කසළ දැමීම තහනම් යනුවෙන් පුවරු සවි කරන ලෙසත්, ගරු උප සභාපති ජේ.ජ්. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

දිවා කාලයේදී දැල්වෙන වීදි පහන් නොදන්වා ඉවත් කරන බවට මහජනතාව දැනුවත් කිරීමේ කටයුතු මේ දිනවල සිදු කරන බවත්, ප්‍රීමික්ස් ව්‍යාපෘතිය නුදුරේදීම ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන බවත්, කපුහෙම්පල සෞඛ්‍ය සායන මධ්‍යස්ථානයේ ඉහළ මහල සඳහා විදුලිය ලබා ගැනීමට අයදුම්පත්‍ර භාර දී ඇති නමුත් තවම ඒ සඳහා ඇස්තමේන්තුව නොලැබුණ බවත්, කපුහෙම්පල මාර්ගයන් අවට කුණු දමන ස්ථාන වල කසළ දැමීම තහනම් යනුවෙන් පුවරු ඉදිරියේදී සවි කරන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මේ දින වල වැසි සහිත කාලගුණයක් පවතින බැවින්, වීදි පහන්වල ස්විච් අනතුරුදායක තත්ත්වයක පවතින බැවින්, වැසි කාලයෙන් පසු දිවා කාලයේදී දැල්වෙන වීදි පහන් ගලවා ඉවත් කිරීමේ කටයුතු සිදු කරන ලෙසත්, ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

වැලිකැටිය වත්ත මාර්ගයට සිලින්ඩර් යෙදවීමට කටයුතු කළාද යනුවෙනුත්, ගොඩකන්ද ප්‍රදේශයේ වතුර බෝතල් කර්මාන්ත ශාලාවක් ඉදිකරන බවටත් සභාව දැනුවත් කර තිබේද යනුවෙනුත් ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් විමසීම් කරන ලදී.

(ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

වැලිකැටිය වත්ත මාර්ගයට යෙදීම සඳහා සිලින්ඩර් මිලදී ගෙන ගෙනවිත් ඇති බවත්, ගොඩකන්ද ප්‍රදේශයේ වතුර බෝතල් කර්මාන්ත ශාලාවක් ඉදිකරන බවට සභාව දැනුවත් කර නොමැති බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් සභාව දැනුවත් කරන ලදී.

කලේගාන පොළ පැවති භූමියේ වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු කරන සේවකයන් සවස් කාලයේදී බීමත්ව පාරේ අශෝභන ලෙස හැසිරෙන බැවින් ඒ සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලෙස ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

ඒ සම්බන්ධව අදාළ කොන්ත්‍රාත් ආයතනය වෙත දැනුම් දෙන බවට, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

කරාපිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාශය සඳහා සේවා පියසක් ඉදිකිරීමට සභාවේ එකඟතාවය ලබා දුන්නේද යන බවත්, අදාළ ඉඩමේ පර්චස් 7 ක බිම් කොටස පමණක් මැන වෙන්කර ගැනීම ප්‍රමාණවත් බවත්, ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් විමසීම් කරන ලදී.

(ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සහ ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

කරාපිටිය කොට්ඨාශය සඳහා සේවා පියසක් ඉදිකිරීමට සභාවේ එකඟතාවය ලබා දී ඇති නමුත් ඒ සඳහා අවශ්‍ය අනෙකුත් සියළුම කටයුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා සිදු වන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් සභාව දැනුවත් කරන ලදී.

එම ඉඩම වෙන්දේසි ඉඩමක් නොවන බැවින්, අදාළ පර්චස් 7 ක ඉඩම පොදු ඉඩමක් නොවන බවත්, ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

කරාපිටිය ප්‍රදේශයේ සේවා පියස ඉදිකිරීමේ ගැටළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මැදිහත් වීමෙන් ඉදිරියේදී නිරවුල් කර ගනු ලබන බවට, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් සභාව දැනුවත් කරන ලදී.

වක්වැල්ල එළගොරකගහ වත්ත ප්‍රදේශයේ අවට ප්‍රදේශවාසීන්ට හිරිහැර ලෙස පවත්වා ගෙන යනු ලබන ගරාජය නීති විරෝධී බවට මධ්‍යම පරිසර අධිකාරිය විසින් දැනුම් දී ඇති බවට, ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම ගරාජයේ කටයුතු නවත්වන ලෙසට අප ප්‍රාදේශීය සභාව මගින්ද දැනුම් දී ඇති බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ප්‍රදේශවාසීන්ට අවහිරතා ඇති වන ලෙස පවත්වාගෙන යනු ලබන එම ගරාජය වෙතින් අප ප්‍රාදේශීය සභාව මුදල් අය කිරීමක් සිදු කරනවාද යනුවෙනුත් ඉන්ධන දීමනාව ලබා ගැනීම සඳහා ඉන්ධන බිල් ඉදිරිපත් කිරීමේ ගැටළුවක් පැන නැගී ඇති බැවින්, ඒ සඳහා වෙනත් විකල්පයක් තිබේද යනුවෙනුත් ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් විමසීම් කරන ලදී.

නේවාසික භාවිතය සඳහා අනුමත කරන ලද ඉඩමක ගරාජයක් පවත්වා ගෙන යාම නීති විරෝධි බැවින්, ඒ සඳහා මුදල් අය කිරීම සිදු කළ නොහැකි බවට දැනුම් දුන් බවටත්, ඉන්ධන දීමනාව ලබා ගැනීම සඳහා අනිවාර්යයෙන්ම ඉන්ධන බිලක් ඉදිරිපත් කළ යුතු බවටත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා සභාව දැනුවත් කරන ලදී.

සිට්ට්‍රස් වත්තේ ආදාහනාගාරය ඉදිකිරීම සඳහා දැන් අවසන් කටයුතුවල සිටින බැවින්, ඒ සඳහා විරෝධතා තිබෙන පුද්ගලයන් හට අවශ්‍ය නම් ආදාහනාගාරය ඉදිකිරීම සම්බන්ධව නීතිමය පියවර ගන්නා ලෙස දැනුම් දෙන ලෙසත්, ආදාහනාගාරයක් නොමැතිකමින් බලප්‍රදේශයේ ජනතාව අපහසුතාවයන්ට ලක් වී ඇති නිසා මෙහි ඉදිකිරීම් කටයුතු කුමන හේතුවක් නිසාවත් නොනවත්වන ලෙසත්, ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

(ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

සභා රැස්වීමේ කටයුතු නිරීක්ෂණය සඳහා සහභාගි වූ පළාත් පාලන සහකාර කොමසාරිස් සමීර වික්‍රමසිංහ මහතාට සහ විමර්ශන නිලධාරි ඒ.එච්.එම්.එන්. උදයසිරි මහතාට සභා රැස්වීමේ නිරීක්ෂණ දැක්වීම සඳහා ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කාරක සභා අවස්ථාවක් යොජනා කරන ලද අතර එම යෝජනාව ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කාරක සභා අවස්ථාවේදී පළාත් පාලන සහකාර කොමසාරිස් සමීර වික්‍රමසිංහ මහතා විසින් සභා රැස්වීම් කටයුතු සිදු කිරීම සම්බන්ධව ලේකම්වරුන් සහ සභා කටයුතු විෂය නිලධාරීන් දැනුවත් කිරීම සඳහා පුහුණු වැඩමුළුවක් සංවිධානය කර ඇති බවත් මෙම සභාවේ වාර්තාවද පරීක්ෂා කොට නිරීක්ෂණ ඉදිරියේදී ලබා දෙන බවත්, නිවැරදි ආකාරයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කරන ආකාරය පිළිබඳව දැනුවත් කරන ලදී.

කාරක සභා අවස්ථාවේදී විමර්ශන නිලධාරි ඒ.එච්.එම්.එන්. උදයසිරි මහතා විසින් රැස්වීම් කටයුතු සිදු කර ගෙන යාම සම්බන්ධව ඇති කාර්ය පටිපාටික රීති අනුව මහා සභා රැස්වීමක් පැවැත්වීමේ වැදගත්කම සහ වාර්තාකරණය පිළිබඳවත් අධිභාර ක්‍රියාවලියක් සිදු කරන ආකාරය පිළිබඳවත් දැනුවත් කරන ලදී.

කාරක සභා අවස්ථාව අවසන් කිරීමට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කාරක සභා අවස්ථාවක් යොජනා කරන ලද අතර, එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සභා රැස්වීම් කටයුතු නිරීක්ෂණය සඳහා සහභාගි වූ පළාත් පාලන සහකාර කොමසාරිස් සමීර වික්‍රමසිංහ මහතාට සහ විමර්ශන නිලධාරි ඒ.එච්.එම්.එන්. උදයසිරි මහතාට අප ප්‍රාදේශීය සභාව වෙනුවෙන් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් ස්තුතිය පළ කරන ලදී.

**මහා සභා රැස්වීම සඳහා සහභාගී නොවූ ගරු සභිකවරු**

01. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
02. ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය

**සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.**

මීළඟ මහා සභා රැස්වීම 2021-12-15 වන බදාදා දින පෙ.ව 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.